# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2015/48 - 2017 අප්‍රේල් මස 20 වැනි බ්‍රහස්පතින්ද - 2017.04.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

ජාතික ක්‍රීඩා සංගම් නියෝග මාලාවේ 32 සහ 33 වගන්ති යටතේ නියෝග

ක්‍රීඩා අමාත්‍ය දයාසිරි ජයසේකර වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32(ආ) සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල අනුව බැඩ්මින්ටන් ක්‍රීඩාව සඳහා ජාතික සංගමය වන ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමයේ ලියාපදිංචිය වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන අතර, තාවකාලික වැඩපිළිවෙලක් වශයෙන් එකී ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමයේ කටයුතු තවදුරටත් පවත්වා ගෙන යාම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වන සාමසුන්දර ඒකනායක රාජවර්ධන තෙන්නකෝන් මුදියන්සේලාගේ සමන් ප්‍රියන්ත බණ්ඩාර මහතා 2017.04.19 වන දින සිට නිසි බලධරයා වශයෙන් පත් කරන අතර, ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමයේ 2017 වර්ෂය සඳහා නව නිලධාරි මණ්ඩලය පත් කර ගැනීම පිණිස නිලවරණය කැඳවීමට හා පැවැත්වීමටත් මෙයින් නියම කරමි.

නීතිඥ දයාසිරි ජයසේකර,  
ක්‍රීඩා අමාත්‍ය.

2017 අප්‍රේල් මස 19 වැනි දින,  
කොළඹ දී ය.

05- 120

1A - G 25443 — 12 (2017/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*